**කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2021**

**-----------------------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1 මතය

------

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිත කර ඇති බව.

1.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.49,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතු 03 ක ආයෝජනය කර තිබුණි. | ආයතනයේ පාලක මණ්ඩල අනුමැතීන් සහිතව ආයෝජනය කර මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා යොමු කර ඇති බව. | මුදල් පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය. | 2017 සිට 2021 දක්වා වූ කාලය සඳහා පිළියෙල කර තිබුණු සංයුක්ත සැලැස්ම විගණකාධිපති වෙත හා අදාළ ආයතන වෙත ඉදිරිපත් කර නොතිබුණි. | දැනට ක්‍රියාත්මක වන 2022 - 2026 සංයුක්ත සැලැස්ම මේ වන විටත් අදාළ ආයතනවලට යොමු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් මාසයේදී නිකුත් කර තිබුණු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතනයන්හි උපාධි පාඨමාලා සමාලෝචනය සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 07 වන මාර්ගෝපදේශය | ආයතනය විසින් පවත්වනු ලබන විභාග සැලැසුම් කිරීම, ප්‍රශ්න පත්‍ර පිළියෙල කිරීම, ඒවා වැඩි දියුණු කිරීම, හරි වැරදි බැලීම, ශ්‍රේණිගත කිරීම සහ සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන නිශ්චිත ක්‍රමවේදයක් සහ ප්‍රමිතීන්ද, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඇගයීමේ ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහ ප්‍රමිතිය පවත්වාගෙන යාම සඳහා බාහිර ප්‍රවීන ආචාර්යවරුන්ගේ සහාය ලබාගෙන දෙවනවර පිළිතුරු පත්‍ර ඇගයීමේ විධිමත් ක්‍රමවේදයක්ද පිළියෙල කර පාලක සභාවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | මෙම ක්‍රමවේදය විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා පශ්චාත් උපාධි ආයතන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත කමිටුවක් මගින් සැලැසුම් පිළියෙල කරමින් පවතින බව. | අදාළ මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.55,990,259 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.63,559,843 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,569,584 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අභ්‍යන්තර ඉපැයීම් රු.14,359,193 කින් අඩුවීම හා නඩත්තු වියදම රු.547,962 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු මුළු වටිනාකම රු.444,427,072 ක ස්ථාවර තැන්පතු, 2021 දෙසැම්බර් 31 දින වන විට රු.692,976,053 ක් දක්වා රු.248,548,981 කින් එනම් සියයට 55 කින් වැඩිවී තිබුණි. 2017 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු මුළු ප්‍රදාන රු.45,659,896 ක්වූ අතර සමාලෝචිත වර්ෂය වන විට එය රු.68,307,000 ක් දක්වා රු.22,647,104 කින් එනම් සියයට 50 කින් වැඩිවී තිබුණි. ඒ අනුව ආයතනය සතු ස්ථාවර තැන්පතු ප්‍රමාණය පසුගිය වර්ෂ 05 ක කාලය තුළදී රු.මිලියන 248 කින් පමණ වැඩිවී තිබියදීත් භාණ්ඩාගාරයෙන් ලබා ගන්නා ලද රාජ්‍ය ප්‍රදාන ප්‍රමාණයද රු.මිලියන 22 කින් වැඩිකර ගෙන තිබුණි. | 2021 වර්ෂයේදී මිලියන 138 ක් වූ මුළු මෙහෙයුම් වියදවලින් මිලියන 73 ක් හා ප්‍රාග්ධන වියදමින් සියයට 75 ක් ආයතනයේ ඉපැයීම්වලින් ආවරණය කර ඇති බව හා භාණ්ඩාගාර ප්‍රදාන ආයතනයේ අවශ්‍යතා හඳුනා ගැනීම මත පමණක් ලබා ගෙන ඇති බව. | රජයේ වැයබර අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොන්ත්‍රාත් වටිනාකම රු.2,100,000 ක් වූ ගිණුම්කරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත රු.1,050,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. වැඩ අවසන් කළ යුතු බවට ගිවිසුම් ගත කාල පරිච්ඡේදය අවසන්වී වසර 03 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණු නමුත් පරිගණක පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වන බව. | ගිවිසුම්ගත කාල සීමාව තුළ අදාළ සේවාව සපයා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාතරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියකට අනුව නිලධාරීන් ස්ථාන මාරු නොකිරීම හේතුවෙන් නිලධාරීන් 31 දෙනෙකු වසර 06 සිට වසර 39 දක්වා කාලයක් එකම ස්ථානයක සේවය කරන බව නිරීක්ෂණය විය. | කළමණාකාරීත්වයේ අභිමතය පරිදි මේ පිළිබඳව සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව. | නිලධාරීන් සඳහා විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් පිළියෙල කර ඒ අනුව කටයුතු කළ යුතුය. |